# මහාමාර්ග අමාත්‍යාංශය

මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘතීන්හි ව්‍යාපෘති ගණකාධිකාරී තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘති මහාභාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) වශයෙන් ස්ථාපිත කොට ඇත.

**තනතුර -**

**ව්‍යාපෘති ගණකාධිකාරී -**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා පුරප්පාඩු අවශ්‍යතාවය මත බඳවාගැනේ.

**තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දක්වා ඇත.**

**01. ව්‍යාපෘති ගණකාධිකාරී (PS 4) (ඇමරිකන් ඩොලර් මිලියන 250 ට වැඩි ව්‍යාපෘති සඳහා)**

**අවම සුදුසුකම් සහ පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබාගත් මූලික උපාධියක්

**හෝ**

ගණකාධිකරණ විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ උපාධියකට සමාන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබාගත් වරලත් සාමාජිකත්වය (ආශ්‍රිත) හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

**සමග**

ගණකාධිකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් සහිත පළපුරුද්ද

02. ගණකාධිකරණ විෂය ක්ෂේත්‍රයට අදාළ රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල හෝ සමාන සේවා තත්ත්වයේ III/II හෝ ඊට ඉහළ පන්තීන්ට අයත් නිලධරයෙකු වීම

**සමග**

III/II වන පන්තියේ ගණකාධිකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද ලබා තිබීම

**කොන්දේසි**

**01. වයස් සීමාව :**

ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු අවසාන දිනට වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.

**02. වැටුප :**

මහාභාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම්ව ගෙවනු ලැබේ.

**03. සේවා කොන්දේසි :**

මූලිකව වසර 1 ක කාලපරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ඇත. කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිවනු ඇත.

**04. වෙනත් ප්‍රතිලාභ :**

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් දයක කරනු ලබන 8% සඳහා ව්‍යාපෘතිය විසින් 12% ක් දයක කරනු ඇති අතර, සේවක භාරකාර අරමුදල සඳහා 3% ක අතිරේක දයකත්වයක් සපයනු ඇත.

සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරමින් අයදුම්කරු පිළිබඳව තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් ද සහිතව සකස් කරන ලද අයදුම්පත් 2021.05.04 දිනට පෙර ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය, **"මගනැගුම මහමැදුර"**, අංක 216, **ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත. බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරේ **"ව්‍යාපෘති ගණකාධිකාරී තනතුර සඳහා අයදුම් කිරීම (ඇමරිකන් ඩොලර් මිලියන 250 ට වැඩි)"** යන්න සඳහන් කළ යුතුය. තවද ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍ර මහාමාර්ග අමාත්‍යාංශයීය වෙබ් අඩවිය වන mohsl.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගෙන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. දැනටමත් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරීන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ව්‍යාපෘති තනතුර සඳහා මේ වන විට සේවයේ යෙදී සිටින නිත්‍ය තනතුරින් නිදහස් කිරීමේ එකඟතාවය පැහැදිලිව සඳහන් කරමින් අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමග අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, එසේ නොඑවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

**ලේකම්,**
**මහාමාර්ග අමාත්‍යාංශය.**